# සමාජ සංස්ථා ඇසුරෙන් ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතියේ වෙනස්වීම පිළිබඳ අධ්‍යයනයක්

(විදේශීය ලේඛකයන්ගේ ගවේෂණාත්මක මූලාශ්‍රය ආශ්‍රයෙන්)

එස්.බී.එම්.එන්.ඩබ්ලිව් ජයසූරිය[1], එම්.ඩී.ජයසේන[2], එල්.ඩී.එම්.ප්‍රේමරත්න[3]

[1]අපරාධ විද්‍යා හා යුක්ති අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල
wimukthijayasooriya212@gmail.com
[2]සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
madhusankadananjaya1993@gmail.com
[3]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

rajapelapatha.prem@gmail.com

ප්‍රමුඛ පද:සමාජය, සංස්කෘතිය, සමාජ සංස්ථා, සමාජ වෙනස්වීම, අවියෝජනීය, ප්‍රතිසංස්කෘති

## හැඳින්වීම

පුද්ගලයන් සමූහයකගෙන් යුත් සංස්ථාවක් සමාජයක් ලෙස හැඳින්වේ.එම සමාජය පවුල,අධ්‍යාපනය ,දේශපාලනය, ආර්ථිකය යන සාධකයන් මත විතැන් වීමකි.යමෙක් මිනිස් සමාජයක් දෙස අධ්‍යයනය කරන්නේ නම් සංස්කෘතිය පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ. ඒ සෑම මිනිස් සමාජයකම මූලික පදනම සංස්කෘතිය වන නිසාවෙනි. ප්‍රාථමික, ද්විතීයික, නාගරික හෝ ගැමි ජන සමාජය හෝ වේවා සෑම ජන සමාජයකම සංස්කෘතියක් පැවතිම පොදු ලක්ෂණයකි. සමාජයක් සංස්කෘතියක් අතර ඇති අවියෝජනිය සම්බන්ධතාව නිසා ඇතමෙක් සමාජයත් සංස්කෘතියත් දෙකක් නොව එකක් ලෙස දකිති.

"උපකරණ, පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ, මානව සංකල්පනා, ශිල්ප හා විශ්වාසහා චාරිත්‍රයන්ගෙන් අනුබද්ධ සමාජයසංස්කෘතිය යි"

(B. Malinowsky,Ascientific Theory Of Culture- 1944)

G.P Murdock ට අනුව සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ 07 කි.

i. සංස්කෘතිය පුරුද්දෙන් හා දැනීමෙන් ලබා ගන්නා දෙයකි.

ii. සංස්කෘතිය පරපුරෙන් පරපුරට පැවත යයි.

iii. සංස්කෘතිය සමාජයේ පැතිර යාමේ ගුණයෙන් යුක්ත වේ.

iv. සංස්කෘතිය පරමාදර්ශීය වේ.

v. සාමාජික තෘප්තිය දැක්වීමේ ස්වභාවයක් ඇත.

vi. අවස්ථාවෝචිතව සකස්වීමේ ගුණාංගය පවතියි.

vii. සමෝධාන ගුණාංගය පවතියි.

ශ්‍රී ලංකාව අවුරුදු දෙදහස් පන්සියයක ඉතිහාසයක් පවතින රටක් ලෙස ප්‍රචලිතය. යටත්විජිතකරණය, ගෝලීයකරණය, නාගරිකරණය වැනි සාධකයෝ මත විවිධ විපර්යාසයන්ට ශ්‍රී ලාංකේය සමාජය බලපෑමට ලක්වුව ද එකී විපර්යාසයන් තුළින් සමාජ ප්‍රගමනයට යම් කිසි දායකත්වයක් ලැබුණ බව පැහැදිලිය. එකී විපර්යාසයන්ට පෙර සහ පසු ද ශ්‍රී ලාංකේය සමාජය දෙස දේශීය සහ විදේශික දෙපිරිසගේම අවධානයට ලක්වුහ. විවිධ කාල වකවානු තුළ දි ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් දේශ ගවේෂණය, සමීක්ෂණ ආදි දැ පදනමෙන් එකල්හි ශ්‍රී ලාංකේය සමාජය විනිවිද දැක ඇත. සමහරක් කාලයත් සමග තුලනාත්මකව එදා මෙදා තුර සංසන්දනය කරන ලද්දෝ වෙති. ඒ අතුරෙන් **රොබට් නොක්ස් ගේ "එදා හෙළදිව", ස්පිටිල්ගේ "සුදුවැද්දා", ජොන් ඩොයිලිගේ "ඩොයිලි දුටු උඩරට රාජ්‍යය", ජොනතන් ස්පෙන්සර්ගේ "ශ්‍රී ලංකාවේ සාමූහික ප්‍රචණ්ඩත්වය හා එදිනෙදා හුරුපුරුද්ද", මහාචාර්ය වික්ටෝරියා බෙකර්ගේ "සුදුවතුරාර ගම", පිලිතියස්ගේ "පිලිතියස් දුටු ලංකාව"**යන කෘතිවිශේෂය. ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික වෙනස්කම් සමාජ සංස්ථාවලට බලපාන අයුරු විදේශීය ලේඛකයෝ ඔවුන්ගේ කෘති තුළින් හඳුනාගෙන ඇත්තේ කෙසේද? විදේශික ලේඛකයන් ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික වෙනස්කම් ඒ ඒ කාලානුරූපිව තමන්ගේ කෘති තුළින් පිළිඹිබු කර ඇත්තේ කෙසේදැයි අධ්‍යයනය කිරීම මෙහි මූලික අරමුණයි. ඒ ආශ්‍රයෙන් ඉහත කෘති අළලා එදා මෙදා තුර සමාජයේ පැවති, පවතින ප්‍රගමනයන්, අපගමනයන් හඳුනාගැනීමත් සංස්කෘතික ලක්ෂණ මුඛ්‍ය කරගනිමින් උප සංස්කෘතික ලක්ෂණ, සංස්කෘතික රාශිකෘතිය, සංස්කෘතික අනුකලනය, ප්‍රතිසංස්කෘතිය, සංස්කෘතික ලැග්ම යනාදිය මින් අධ්‍යයනය කෙරේ. විදේශීය ගවේෂකයන් විසින් ශ්‍රී ලාංකේය සමාජය විශ්ලේෂණය කර ඇති අයුරු එහිලා පාදක ව අදාළ කර්තෘන් ගේ මතවාදයන් අධ්‍යයනයන් මෙහි වැදගත්කොට සැලකිය හැකිය.සමාජ සංස්ථා පහ කෙරෙහි ඒ ඒ කාලයන් කෙසේ ආමන්ත්‍රණය කර ඇද්දැයි හඳුනාගැනීමත් එවායේ සවිටනයන් ,ශක්‍යතා, විපර්යාසයන් හඳුනා ගැනීමත් මෙහි දී වැදගත් වනු ඇත.

## ක්‍රමවේදය

සාහිත්‍ය විමර්ෂණය මෙහි ප්‍රධාන ක්‍රමවේදය ලෙස භාවිත කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ජොන් ස්පිටිල්ගේ "සුදුවැද්දා නොලියු කතා" කෘතියෙන් වැදි සමාජයත්, පිලිතියස්ගේ "පිලිතියස් දුටු ලංකාව" කෘතියෙන් ක්‍රි.ව 1815 ට පෙර යුගයේ පටන් ක්‍රි.ව 1815 දක්වා ත් ජොන් ඩොයිලිගේ "ඩොයිලි දුටු උඩරට රාජ්‍යය" කෘතියෙන් ක්‍රි.ව 1815 උඩරට රාජ්‍ය සම්බන්ධයෙනුත් ජොනතන් ස්පෙන්සර්ගේ "ශ්‍රී ලංකාවේ සාමූහික ප්‍රචන්ඩත්වය හා එදිනෙදා හුරුපුරුද්ද" කෘතියෙන් ක්‍රි.ව 1983 වර්ෂයේ ඇති වූ සමාජ විපර්යාසයත් මහාචාර්ය වික්ටෝරියා බෙකර්ගේ "සුදුවතුරාර ගම" කෘතියෙන් ක්‍රි.ව 1984-ක්‍රි.ව 1994 යුගයන් හි සමාජ සංස්කෘතියේ පරිවර්තනය, සමාජ සංස්කෘතියේ වෙනස්වීම යනාදිය මෙකී කෘති තුළින් විස්තර වේ. මෙම කෘති 06 එම බලපෑම සමාජ සංස්ථා තුළින් කෙසේ විවරණය කර ඇද්දැයි සේම සමාජ සංස්කෘතියේ කාලානුරූපී පරිවර්තනය කෙසේ දැයි අධ්‍යයනය කළ හැකිය.එම අධ්‍යයනයෙන් විදේශීය මතවාද අනුව පොදුවේ ශ්‍රී ලංකාව පිළිබඳව එනම් ශ්‍රී ලාංකේය සමාජය, සංස්කෘතිය පිළිබඳව දරන ලද මතවාදයන් සම්බන්ධ ව සාකච්ජා කෙරේ. වර්තමාන සමාජ ප්‍රගමනයට ඒ කෘති තුළින් නිරූපණය වන සමාජ වෙනස්කම් ,

සමාජ සංස්ථාවන්ට බලපාඇතිආකාරයත් ඒවා ධනාත්මකව,සෘණාත්මකවත් සෘජුව හා වක්‍රවත් කෙසේ බලපා ඇද්දැයි යන්නත් මෙහි දී සාකච්ජාවට බදුන්වනු ඇත.එකීකෘති තුළින් පිළිඹිබු වන උප සංස්කෘති, සංස්කෘති රාශිකෘතිය, සංස්කෘතික අනුකලනය,ප්‍රතිසංස්කෘති ද මෙයන් අධ්‍යයනය කරයි.

## නිගමනය

- සමාජ වෙනස්වීම ඓතිහාසික හා පරිනාමීය වෙනස් විමකි.
- සමාජ සංස්කෘතික වෙනස්විම් සමගින් සමාජයේ වැදගත් අනුකොටසක් විසින් (සමාජ සංස්ථා-පවුල, ආගම, අධ්‍යාපනය, ආර්ථිකය, දේශපාලනය) අර්ථ උසුලන ලද කාර්යභාරයන් වෙනස් වේ.
- යටත්විජිතකරණය, ගෝලීයකරණය, නාගරිකරණය, වැනි සාධක ශ්‍රී ලාංකේය සමාජයත් සංස්කෘතියත් වෙනස් කිරිමට පාදක විය.
- සමාජ වෙනස් වීම් සමාජයේ ප්‍රගමනයටත්, අපගමනයටත් සෘජුව සහ වක්‍රව බලපා ඇත.
- සංස්කෘතියේ වෙනස්වීම සමාජය මතත්, සමාජයේ වෙනස් විම සංස්කෘතිය මතත් අවියෝජනිය බලපෑමක් සිදු කරයි.
- එම අවියෝජනීය බලපැම සෘජු හා වක්‍රව සමාජ සංස්ථා කෙරේ බලපායි.
- සමාජ අපගමනයන් අතර "අපරාධ" ප්‍රධාන අපගාමී චර්යා වේ.
- අපරාධ සමාජ සංස්ථාවන්ට සෘණාත්මක බලපැමක් සිදු කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


ස්පෙන්සර්, ජොනතන්. (2010)*ශ්‍රී ලංකාවේ සාමූහික ප්‍රචණ්ඩත්වය සහ එදිනෙදා හුරුපුරුද්ද*. දිසානායක, අබේ.(පරි). රාවය ප්‍රකාශනය.

ඩොයිලි, ජෝන්. (2011)*ඩොයිලි දුටු උඩරට රාජ්‍යය.* උපාලි රත්නායක. (පරි). කොළඹ 10: ෆාස්ට් ප්‍රින්ටරි.

පිලීතියස්, *පිලීතියස් දුටු ලංකාව*,ජයකොඩි,පාලිත. (පරි).කොළඹ 10: දයාවංශ ජයකොඩි සහ සමාගම.

ජොන්, ස්පිටල්. (2017). *සුදු වැද්දා නොලියූ කතා.* ජයවීර, විජයපාල.(පරි). කොළඹ 12: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.